

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

"යො ඉමං සමුදදං සගාහං - සරකබසං සඤමිහයං දුතතරං අවවතරි
ස වෙදගූ වුසිතබ්‍රහමචරියො - ලෝකනතගූ පාරගතොති වුවචතීති."

"යමෙක් නපුරු මත්ස්‍යයින්, රකුසන්, රළබිය සහිත තරණය කිරීමට අපහසු මෙම මුහුද තරණය කරයි නම් ඒ තැනැත්තා මාර්ග ඥාණයෙන් නිවන් අවබෝධ කළේ වැස නිමවූ බඹසර ඇතිව ඉපදීම නතර කොට නිවන් නැමති පරතෙරට පැමිණියා යයි කියනු ලැබෙයි."
(සංයුතත නිකාය සමුදදවගගය සමුදද සූත්‍රය)

ධර්මකාමී පින්වතුනි,

අද මැදින් පුර පසළොස්වක පොහොය දිනයයි.භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුර නුවර වෙත වැඩම වීමට ගමන ආරම්භ කළේ අද වැනි පොහොය දිනයකය. එවැනි වටිනා පොහෝ දිනක මෙම දහම් පණිවුඩයට මාතෘකා කරන ලද්දේ සමුද්ද සූත්‍රයයි. අද මෙම දහම් පණිවුඩයෙන් අපේක්ෂා කරන්නේ අපි අසා ඇති "සංසාර සාගරය"යන වචනය අපේ ව්‍යවහාරයට පැමිණි ආකාරය සහ එම " සසර සයුර" තරණය කිරීමට බුදුරජාණන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් පෙන්වන ලද ධර්ම මාර්ගය විමසා බැලීමයි. මහ මුහුදයයි කියූ විගස අපේ සිතට දැනෙන ආකල්ප රාශියකි. මහ මුහුද චිත්තාකර්ශනීයයි. භෞතික සම්පතකි. අප ජීවිතයේදී ගැඹුරු සහ විශාලත්වයට නිදසුනත් මහ මුහුදමය. ඒ වගේම මහ මුහුදෙහි විවිධ බිය දක්නට ලැබේ. ගැඹුරු ආවාට, මහරළ, දියසුලි, දරුණු මත්ස්‍ය විශේෂ මෙන්ම මුහුදට අරක්ගත් අමනුෂයින්ගෙන්ද බිය ඇති වේ. මනුෂ්‍යයින් වශයෙන් මුහුද සම්බන්ධයෙන් අප කළ යුතු වන්නේ බිය දුරුකොට මහ සමුද්‍රයෙන් ගතහැකි ඵල ලබා ගැනීමය.

අප තථාගතයන් වහන්සේ මෙම සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙන්නේ ඉහත කී මුහුදට වඩා මුහුද යන වචනයේ පරිසමාප්ත අර්ථයෙන් යුතු මහ මුහුදකි. භික්ෂූන් වහන්සේ අමතා මෙසේ වදාරා ඇත. " මහණෙනි අශ්‍රැතවත් පුහුදුන් පුද්ගලයා ඇසට පෙනෙන මුහුදට මුහුද, මුහුද යයි කියයි. මහණෙනි එය බුද්ධ ශාසනයෙහි මුහුද නොවේ. ආර්ය විනයට අනුව මහා දිය රාශියක් මහදිය කඳක් ලෙසින් ඇස,කන,නාසය, දිව, ශරීරය, මනස මහා සාගරය "ය යි වදාළහ. වදාළ පරිදිම පුහුදුන් මනුෂ්‍යයින් වන අපිට දක්නට තිබෙන භෞතික මුහුදට වඩා එතෙර වීමට අපහසු නොසිඳෙන ලක්ෂණයක් සංසාර සාගරයෙහි ඇත. ඒ බව සංයුත්ත නිකාය ගද්දුලබද්ධ නැමති සූත්‍රයෙන් තහවුරු වේ."මහණෙනි යම් කළෙක මහමුහුද සිඳුනත් වියළුනත්, මහමේරුව දැවුනත් වැනසුනත්, මහපොළාව දැවුනත් වැනසුනත්

සසර දුවන සත්වයාගේ සංසාර දුක කෙළවරක් මම නොකියමි"යි වදාරා ඇත. බුදු දහම වනාහී සංසාරය නැමති සාගරයෙන් පරතෙරට යෑමට හෙවත් නිර්වාණය නැමති ක්ෂේම භූමියට යෑමට මෙහෙයවන දර්ශනයකි. එම ප්‍රතිපදාව තුළ මෙම පෙන්වා වදාළ අකාර හයකින් යුතු මුහුදේ රස වේගයන්ට ගිජු වීම, ඇලීම, බැඳීම, ඒ කෙරෙහි ලොල් වීම දැඩි කැමැත්ත බැහැර කළ යුතුය. එසේ නොවී යමෙක් ඒ රස වේගයන්ට ඇලුනවිට මහ මුහුදේ ඇති ඉහත කී බියවලට ගොදුරු වෙයි.

බුදුරජාණන් වහන්සේ සමුද්‍ර උපමාවෙන් ඇස ආදී ආයතන හයෙන් යුතු මෙම මහා සමුද්‍රය තරණය කළ යුත්තක් බවට වදාරා ඇත්තේ "සමුදද" යන වචනයේ අර්ථයට අනුවමය. මුහුද, සාගරය, ඕෂය යන වචන වලින් හැඳින්වෙන්නේ මහා මුහුදමය."සමුදද"යන්නට මෙම සූත්‍ර අටුවාව අර්ථ දෙන්නේ පිරවීමට හෙවත් සෑහීමට පත්වීමට අපහසු සහ කෙළෙස් ඉපදීමට හේතුවන පරිදි යන්නේය, මතුවන්නේය යන අර්ථයෙනි. මේ ආකාරයට මහා සමුද්‍ර හයක් අප තුළ වෙයි. ඒ තුළ රස නම් වූ මහා රළ වේග හයකි. මෙම රළ වලට හසුවී මහ මුහුද මැදට ගසාගෙන යෑම සංසාර සාගරයේ දුක් විඳීමය. ඒ අතරට කෙළෙස් නැමති දිය සුළිවලට, රකුසන්ට, ක්‍රෝධ සිත් තැවිලි නැමති රළපහර වලට හසුවී නොතිර සසර සාගරය තුළ ඉපදෙමින් මැරෙමින් ගත කරයි.

භාග්‍යවතුන් වහන්සේ පළමුවෙන් "මහණෙනි ඇස මුහුදකි"යි වදාරා ඇසට ගොදුරු වන අරමුණු හෙවත් රූප, රස වේගය ලෙසට දක්වා ඇත. මහපොළොවේ සිට අකණිටා බඹලොව දක්වා ඇති රූපමය වේගයන්ට සත්වයා හසුවේ. ඒ ඒ සත්වයන්ට රූපමය අරමුණු කොපමණ ඇසින් දැකීමෙන් සෑහීමකට පත් නොවීම නිසාම ඇස මුහුදකි. මේ ආකාරයට කන මුහුදකි, කනට ශබ්ද රස වේගයකි.නාසය මුහුදකි, නාසයට ගඳ සුවඳ රස වේගයකි. දිව මුහුදකි, දිවට රස, රස වේගයකි. කය මුහුදකි, කයට පහස (ස්පර්ෂය) රස වේගයකි. සිත මුහුදකි, සිතට ධර්මතා රස වේගයකි. අකණිටා බඹලොව දක්වා දැක්වූ පරිදිම කනට, නාසයට, දිවට,ශරීරයට, සිතට ගන්නා අරමුණු මගින් ද සෑහීමකට පත්විය නොහැකි බැවින් මුහුදක්මය. යමෙක් මේ රළ වේගයන්ට සමාන රූප, ශබ්ද....ආදී අරමුණු කෙරෙහි ඇලුනොත් ඔහු මුහුදෙහි වූ බිය උපදවන දැයට හසුව විනාශ වෙයි. එහෙත් වීර්යවත්, ප්‍රඥාවන්ත,සීලවන්ත, ශ්‍රද්ධාවන්තයා හෙවත් ශ්‍රී සද්ධර්මය විශ්වාස කරන්නා රළ,සුළි, සැඩමසුන්, රකුසන්, සහිතවූ රූප ශබ්දාදී අරමුණු නම්වූ රළ වේග තරණය කළේ නම් ඔහු පරතෙරට පැමිණියාය. මෙහිදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ ඒ සංසාර සාගරයෙන් එතෙර වීමේ දහම් න්‍යායයි.

● ඇස සංවර වීම යනු රූප නම් වූ රස වේගය ඉවසීමය. ඇස් දොරට හිත වූ රූප අරමුණක් හමුවූ විට ලෝබ=(ඇලීම්) නොඉපදවීමද, ප්‍රිය නොවූ රූප අරමුණක් හමු වූ විට දෝස =(කෝප) නොඉපදවීමෙන්ද, සිහියෙන් විමසීමෙන් යුතු නුවණින් මෙනෙහි කොට රූප අරමුණු නිසා මෝහ=(මුලා) නොවීම ඇසරැක ගැනීමය.

● කනින් සංවර වීම යනු හිතවූ ශබ්ද අරමුණක් ලැබුන විට එහි ලෝබ නොඉපද වීම. අප්‍රිය ශබ්ද අරමුණු ලැබුන විට එහි කෝප නොඉපදවීම සහ ශබ්ද අරමුණ නොවිමසීමෙන් අනුවනින් ගෙන මෝහය නොඉපදවීම ශබ්ද අරමුණ ඉවසීමය.

• නැහැ දොරටුවට හිතවූ ගන්ධ අරමුණක් ලැබුනු විට ලෝබ නොඉපදවීමද, අහිතවූ ගන්ධ අරමුණක් ලද විට කෝප නොඉපදවීමද, අරමුණ නොවිමසා අනුවනින් ගෙන මෝහය නොඉපදවීම ගන්ධ අරමුණ නැමති රස වේගය ඉවසීමය.

• දිවෙන් සංවර වීම යනු හිතවූ රස අරමුණක් ලැබුන විට එම රස වේගයට ලෝබ නොඉපදවීම,අහිත අමනාප රස අමුණකදී කෝප නොඉපදවීම සහ රස අරමුණ නොවිමසා අසිහියෙන් ගෙන මෝහය නොඉපදවීම රස වේගය ඉවසීමය.

• කයෙන් සංවර වීම යනු කයට හිතවූ පහසක් (ස්පර්ශය) ලැබුනවිට එහි ඇලී ලෝබ නොඉපදවීම, අප්‍රිය වූ පහසකදී කෝප නොඉපදවීමද, එම අරමුණ නොවිමසා අනුවනින් ගෙන මෝහය නොඉපදවීම එම රස වේගය උපේක්ෂාවෙන් ඉවසීමය. එවිට ප්‍රාණඝාතය, හොරකම, වැරදි කාම හැසිරීම සිදු නොවේ.

• සිතට ප්‍රිය සිතිවිල්ලක් පැමිණිවිට එම රසවේගයට නොඇලීමද, අප්‍රිය අරමුණක් හෙවත් එම දහම්මය රස වේග සමග ගැටී කෝපය නොඉපදවීමද, එම අරමුණ අසිහියෙන් ගෙන මෝහය නොඉපදවීමද මනස රැකගැන්මය එවිට අභිද්‍යාව (දැඩිලෝභය) ව්‍යාපාදය(අනුන්ට හිංසන චේතනාව) මිචඡාදිට්ඨි(වරදවා දැක්ම) යන තුන් දුසිරිත් වලකා ගත හැකිය. මෙසේ ඉහත කී වේග ඉවසීම ඇස, කන, නාසය, දිව, ශරීරය,මනස නැමති මුහුද තරණය කිරීමය.

සංයුත්ත නිකාය ආලවක සූත්‍රයේදී ආලවක යක්ෂයා බුදුරජාණන් වහන්සේගෙන් විමසන්නේ

කථංසු තරතී ඔඝං -කථංසු තරති අණ්ණවං

කථංසු දුකඛං අවෙචති -කථංසු පරිසුජ්ඣති.

"සතර ආකාරවූ ඕඝය, තරණය කරන්නේ කෙසේද? සංසාර සාගරය කෙසේ නම් එතෙර කරන්නේද? දුක ඉක්ම වන්නේ කෙසේද? කෙසේ නම් පිරිසිදු වේද?" ඊට පිළිතුරු දෙන භාග්‍යතුන් වහන්සේ

සද්ධාය තරතී ඔඝං- අපපමාදෙන අණ්ණවං

විරියෙන දුකඛං අවෙචති -පඤ්ඤාය පරිසුජ්ඣති.

"ශ්‍රද්ධාවෙන් ඕඝ තරණය කෙරේ, අප්‍රමාදයෙන් සංසාර සාගරය තරණය කෙරේ, වීර්යයෙන් දුක නැති කෙරේ, ප්‍රඥාවෙන් පිරිසිදු වේ".

ඕඝ යනු සැඩපහරයි.සංසාර සාගරයෙහි එම සැඩ පහර සතරකි. එහි පංචකාම ධාතුයෙහි පවතින ඡන්දරාගය හෙවත් කැමැත්ත "කාමඕඝය"යි. රූප, අරූප, ලෝකවල ඉපදීමට ඇති ඡන්දරාගය"භවඕඝ" නම් වේ. හැට දෙකක්වූ දෘෂ්ඨීන් "දිට්ඨිඕඝය"යි ආර්‍ය්‍ය සත්‍ය නොදන්නා කම"අවිජ්ජාඕඝය"යි. කරුණු මෙසේ වූවද ලෝක සත්වයා ශ්‍රද්ධාවෙන් තොරව සැඩ පහරින් එතෙරවීම පිළිබඳව නොවිමසති පංචකාම සැපයෙහිම සිත අලවා යහපත් කුසල් දහම් හි ප්‍රමාද වී, එහිම ඇලී ගැලී අකුසලයෙහිම නියැලෙමින් අලසව දුකින් කල් ගෙවති. අනුවන බැවින් පිරිසිදු බවට මග නොදැන සසරටම ඇලෙති.

ඒ අදහස ආලවක යක්ෂයාට "සද්ධාය තරතී ඔඝං"යනුවෙන් ශ්‍රී සද්ධර්මය කෙරෙහි විශ්වාසයෙන් මමත්වය හෙවත් මිසදිටු ආකල්පය නම් වූ සැඩ පහර තරණය කරන සෝවන් මගද, පලයද වදාළහ. එයින් නොනැවතී ප්‍රමාද නොවී එකවරක් පමණක් ලොව උපත ලබන දෙවැනි මාඟිවලය වන සකෘදාගාමී මග පලයට පත්වන ආකාරය "අපපමාදෙන අණ්ණවං" යන පදයෙන් වදාළහ. එයින් නොනැවතී කාම සැඩ පහරයයි සම්මත වූ කාමය නිසා ඇතිවන දුක නැතිකරන "විරියෙන දුකඛං අවෙචති"වීර්යයෙන් දුක

නැති කරන අනාගාමී මග සහ ඵලයද වදාළහ. කාම නැමති මඩ ඉවත් කොට පිරිසිදු ප්‍රඥාවෙන් යුතුව අනාගාමී මග පලයෙන් නැති කිරීමට නොහැකි වූ "අවිජ්ජා" නම් වූ ඉතා අපිරිසිදුම කිළිටි බව නැති කිරීමට" පඤ්ඤාය පරිසුජ්ඣති"යන එම ගාථා පාදයෙන් අරහත් මග සහ ඵලයත් වදාලහ. මේ අරහත් ඵලය දක්වා කළ දේශනාව අවසානයේදී ආලවක යක්ෂයා සෝවාන් ඵලයෙහි පිහිටි බව දැක්වේ.

තවත් එක්තරා අවස්ථාවකදී දෙවියෙක් බුදු හිමියන් වෙත පැමිණ මෙසේ විමසා ඇත." දිවා රාත්‍රී වශයෙන් කාලය ගතවේ. කාලය විසින් පුද්ගලයා මරණය කරා පමුණුවති. අනු ක්‍රමයෙන් වයස ඉක්මයති. මෙම ත්‍රිවිධ භය නිසා පින් කිරීම සැපයකි." ඊට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ"කාලය ඉක්මයති. නිරන්තරව පුද්ගලයා මරණය වෙත පමුණුවති. වයස ක්‍රමයෙන් ගත වේ. මේ භය දකින පුද්ගලයා නිවන නැමති ශාන්තිය අපේක්ෂා කරන්නේ නම් ලෝකාමිෂය (සසර පැවැත්මේ හේතු) දුරුකළ යුතුය"යි සංයුත්ත නිකාය අච්චෙන්ති සූත්‍රයේ දැක්වේ. සාගරය බඳු මේ සසර පැවැත්මේ රස වේග නැමති හේතු නැති කිරීමට එම දේශනාවෙන්ද තේරුම් ගෙන සංසාර සාගරයෙන් එතෙරවීමට අධිෂ්ඨාන කර ගනිමු.